**කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2025.06.16 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව**

සහභාගී වූ ගරු සභික මහත්ම/ මහත්මීන්

| තනතුර | නම |
|---|---|
| 01.ගරු සභාපති | - සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා |
| 02. ගරු උප සභාපති | - L.S.W.K.ඉමදූව මහතා |
| 03. ගරු සභික | - C.A.H.M.නිමල්සිරි චන්ද්‍රසේකර මහතා |
| 04. ගරු සභික | - H.නවරත්න බංඩාර මහතා |
| 05. ගරු සභික | - A.A.ලයනල් මහතා |
| 06. ගරු සභික | - D.U.G.N.B.දොඩම්වල මහතා |
| 07. ගරු සභික | - N.D.L.නිවුන්හැල්ල මහතා |
| 08. ගරු සභික | - A.M.T.සම්පත් අධිකාරි මහතා |
| 09. සමාජ ක්‍රියාකාරී | - රෝහණ සම්පත් දිසානායක මහතා |

**නොපැමිනි සභිකවරුන්**

ගරු සභික M.G.ප්‍රභාත් වීරසේන මහතා

2025 ක් වූ ජූනි මස 16 වන දින පෙ.ව. 10.00 ට කැකිරාව ප්‍රාදේශීය සභා වේ මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතාගේ ප්‍රධානත්වයෙන් කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී ආරම්භ විය.

**ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරිම**

01. අයි.එම්.ජී.බී.ඉලංගසිංහ මහතා, ක්‍රිකට් පුහුණු කරු, ශාස්ත්‍රවෙල්ලිය, කැකිරාව විසින් ක්‍රිකට් පුහුණු කිරිම සඳහා ක්‍රීඩා පිටිය ලබා ගැනීම සම්බන්ධව යොමු කරන ලද ලිපිය

කැකිරාව බල ප්‍රදේශයේ දරුවන්ගේ ක්‍රිකට් කෞශල්‍ය ඉහල නැවීමේ අරමුණින් යුතුව ඉහත ලිපිනයේ සඳහන් වික්ටරි ක්‍රිකට් පුහුණු පාසල පවත්වාගෙන යන ලබන , පුහුණු වීම් කටයුතු කැකිරාව මහජන ක්‍රීඩාංගනය තුල සෙනසුරාදා හා ඉරිදා යන දිනයන් වලදී පවත්වනු ලබන බවත්, එම දිනයන්වලට සාධාරණ මුදලකට ක්‍රීඩා පිටිය ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. එමෙන්ම ක්‍රිකට් උපකරණ ආරක්ෂිතව ලබා ගැනීම සඳහා ප්‍රේක්ෂකාගාරයේ යට කොටස භාවිතා කිරිමට ද අවසර ඉල්ලා ඇත.

ගාස්තු අයකර පුහුණු කිරිමේ කටයුතු සිදු කරන බැවින් , ජලය හා විදුලිය භාවිතා කරන බැවින් ද, වියැකී යන ක්‍රිකට් ක්‍රීඩාව නගා සිටු වීමට කටයුතු කරන බැවින් ආදායම් වියදම් ඇස්තමේන්තුවක් ලබා ගෙන සාධාරණ මුදලකට ක්‍රීඩා පිටිය ලබා දීම සුදුසු බව සාමජිකයින්ගේ අදහස විය.

**කමිටු තීරණ 2025/01**

**ගරු සභික N.D.L.නිවුන්හැල්ල මහතා**

2025 වර්ෂයේ ඉදිරි මාස 06 සඳහා ජලය හා විදුලිය භාවිතා කරන බැවින්, කොන්දේසී ඇතුලත් කර , රු. 15,000 /- ක මුදලකට ලබා දීමට සුදුසු බවට යෝජනා කරන ලදී,

**ගරු උප සභාපති L.S.W.K.ඉමදූව මහතා**

එම් යෝජනාව ස්ථිර කරන ලදී

2025 වර්ෂයේ ඉදිරි මාස 06 සඳහා ජලය හා විදුලය භාවිතා කරන බැවින්, කොන්දේසී ඇතුලත් කර , රු. 15,000 /- ක මුදලකට ලබා දීමට සුදුසු බවට කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02.ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පලුගස්වැව විසින් මැනුම් ගාස්තු දැනුම් දීම සම්බන්ධව යොමු කරන ලද ලිපිය

කැකිරාව ප්‍රාදේශිය සභාවට අයත් පහත සඳහන් ස්ථාන පවරා ගැනීමට අදාලව මැනුම් කටයුතු සිදු කිරිම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැනුම් ගාස්තු ඉදිරිපත් කර ඇති අතර, අදාල ගාස්තු ගෙවන ලෙස ප්‍රාදේශිය ලේකම් විසින් දැනුවත් කර ඇත.

- ප්‍රාදේශිය ලේකම්ගේ අංක PGW/LND/5/5/4/28 හා 2025/05/28 දිනැති ලිපිය- හබරණ පුස්තකාලය පිහිටි ඉඩම - මැනුම් ගාස්තු - රු. 36.000/- වැට් 18% රු. 6480.00 -එකතුව - රු.42,480.00

- ප්‍රාදේශිය ලේකම්ගේ අංක PGW/LND/5/5/4/35 හා 2025/05/28 දිනැති ලිපිය- පලුගස්වැව පොදු වැසිකිළිය පිහිටි ඉඩම - මැනුම් ගාස්තු - රු. 36.000/- වැට් 18% රු. 6480.00 -එකතුව - රු.42,480.00

- ප්‍රාදේශිය ලේකම්ගේ අංක PGW/LND/5/5/4/36 හා 2025/05/28 දිනැති ලිපිය- පලුගස්වැව උප කාර්යාලය පිහිටි ඉඩම - මැනුම් ගාස්තු - රු. 36.000/- වැට් 18% රු. 6480.00 -එකතුව - රු.42,480.00

- ප්‍රාදේශිය ලේකම්ගේ අංක PGW/LND/5/5/4/37 හා 2025/05/37 දිනැති ලිපිය - කාශ්‍යපගම ක්‍රීඩා පිටිය පිහිටි ඉඩම - මැනුම් ගාස්තු - රු. 18,698.71 වැට් 18% රු. 3365.76 -එකතුව - රු.42,480.00

- ප්‍රාදේශිය ලේකම්ගේ අංක PGW/LND/5/5/4/39 දරණ ලිපිය - වායා උල්පත ගබඩාව පිහිටි ඉඩම -මැනුම් ගාස්තු - රු. 36,6515.64/- වැට් 18% රු. 6515.64 එකතුව - රු.42,713.64

**කමිටු තීරණ 2025/02**

**ගරු සභික A.A.ලයනල් මහතා**

කැකිරාව ප්‍රාදේශිය සභාවට අයත් පහත සඳහන් ස්ථාන පවරා ගැනීමට මැනුම් කටයුතු සිදු කිරිම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති මැනුම් ගාස්තු ගෙවීමටත්, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඉදිරිපත් කර ඇති අතර, අදාල ගෙවන ලෙස ප්‍රාදේශිය ලේකම් විසින් දැනුවත් කර ඇති බැවින් අදාල ගාස්තු ගෙවිමට සුදුසු බවට යෝජනා කරන ලදී

**ගරු සභික D.U.G.N.B.දොඩම්වල මහතා**

එම යෝජනාව ස්ථිර කරන ලදී

කැකිරාව ප්‍රාදේශිය සභාවට අයත් පහත සඳහන් ස්ථාන පවරා ගැනීමට මැනුම් කටයුතු සිදු කිරිම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති මැනුම් ගාස්තු ගෙවීමට කටයුතු කිරිම සුදුසු බවට කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

03 .නියෝජ්‍ය අධ්‍යක්ෂ , වයඹ සංවර්ධන අධිකාරිය විසින් (මගුරු ඔය වත්ත, මල් කඩුවාව බෝගනේ ලිපිනය) Cat 2020 මෘදුකාංගය සඳහා සේවා ගිවිසුම්ගත වීම සම්බන්ධව යොමු කර ඇති ලිපිය

වයම පළාත් සභාවේ වයඹ සංවර්ධන අධිකාරිය විසින් දිවයිනේ පළාත් පාලන ආයතන සඳහා මේ වන විට ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබන Cat 2020 මෘදුකාංගය සඳහා සේවා ගිවිසුම්ගත වීම සම්බන්ධව ගෙවීම් කළ යුතුව ඇති බැවින් අදාල ,මුදල ගෙවීම සම්බන්ධව කරන ලද ඉල්ලීම

**කමිටු තීරණ 2025/03**

**ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා**

වයම පළාත් සභාවේ වයඹ සංවර්ධන අධිකාරිය විසින් දිවයිනේ පළාත් පාලන ආයතන සඳහා මේ වන විට ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබන Cat 2020 මෘදුකාංගය සඳහා දක්වා ඇති කාල සීමාවන්ට අදාලව ඉදිරිපත් කර ඇති මුදල් ගෙවීම සුදුසු බවට යෝජනා කරන ලදී .

01.ගිවිසුම් කාලය - 2024.03.15 සිට 2025.12.31 දක්වා
02.මුදල් ගෙවීම - 2024.03.15 සිට 2024.12.31 දක්වා රු. 210,000.00
-2025.01.01 සිට 2025.12.31 දක්වා රු. 280,000.00

**ගරු සභික A.M.T.සම්පත් අධිකාරි මහතා**

එම යෝජනාව ස්ථිර කරන ලදී

Cat 2020 මෘදුකාංගය ස්ථාපිත කර පවත්වාගෙන යාම වෙනුවෙන් බදිරිපත් තකර ඇති කාලසීමාවන්ට අදාලව වයඹ සංවර්ධන අධිකාරිය වෙත අදාල මුදල ගෙවීම සුදුසු බවට කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

04.2025. ජුනි මස 14 වන දින පැවති මිහිඳු පෙරහැරට සමගාමීව පවත්වන ලද කඩල දන්සැල වෙනුවෙන් සභා අරමුදල් ලබා ගැනීම සම්බන්ධව

මල්දෙණිපුර ශ්‍රී විසුද්ධාරාම විහාරය විසින් වාර්ෂිකව පවත්වන ලද මිහිඳු පෙරහැර සඳහා ප්‍රාදේශිය සභාව මඟින් කඩල දන්සැලක් පවත්වන ලද අතර, පරිත්‍යාග වශයෙන් මුදලින් හා ද්‍රව්‍යමය ලෙස ආධාර ලබාදුන් අතර ඒ සඳහා රු. 32.550 /- ක මුදලක් යෙදවීමට ඇති බැවින්, එය සභා අරමුදල් මඟින් ලබා ගැනීමට අනුමැතියට ඉදිරිපත් කර ඇත.

<u>**කමිටු තීරණ 2025/06**</u>
<u>**ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා**</u>
මල්දෙණිපුර ශ්‍රී විසුද්ධාරාම විහාරය විසින් වාර්ෂිකව පවත්වන ලද මිහිඳු පෙරහැර සඳහා ප්‍රාදේශිය සභාව මඟින් කඩල දන්සැලක් පවත්වන ලද අතර, ඒ සඳහා පරිත්‍යාග වශයෙන් මුදලින් හා ද්‍රව්‍යමය ලෙස ආධාර ලබාදුන් අතර, ඉතිරි රු. 32.550 /- ක මුදල සඳහා සභා අරමුදල් මඟින් දායකත්වය ලබා දීමට සුදුසු බවට යෝජනා කරනවා.

<u>**ගරු සභික A.M.T.සම්පත් අධිකාරි මහතා**</u>
එම යෝජනාව ස්ථිර කරනවා.

මල්දෙණිපුර ශ්‍රී විසුද්ධාරාම විහාරය විසින් වාර්ෂිකව පවත්වන ලද මිහිඳු පෙරහැර සඳහා ප්‍රාදේශිය සභාව මඟින් පවත්වන ලද කඩල දන්සැලක් සඳහා වැය වූ ඉතිරි මුදල සභා අරමුදල් මඟින් යෙදවීමට සුදුසු බවට නිර්දේශ කරන ලදී

05.නව ආදායම් උත්පාදන වැඩසටහන් සම්බන්ධව යෝජනා සහ ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව

පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/AC/06/13 හා 2025.05.28 දිනැතිව2025 අයවැය ඇස්තමේන්තු මඟින් සලසන ලද ප්‍රනරාවර්තන ප්‍රතිපාදන සම්බන්ධයෙන් එවා ඇති ලිපියට අනුව
........ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ අයවැය සංශෝධනය කර ප්‍රතිපූර්ණය නොවන 20% වැටුප් ගෙවීම් වලට අදාලව ගත යුතු ක්‍රියා මාර්ග ලෙස ආදායම් උත්පාදන සකස් කළ යුතුව ඇති බැවින්, ඒ සඳහා යෝජනා ලෙස

<u>**ගරු සභික N.D.L.නිවුන්හැල්ල මහතා**</u> කුඹුක සිසිල උද්‍යානය වැඩි දියුණු කර ආදායම් මාර්ගයක් සකස් කිරිමටත් <u>**ගරු සභික A.M.T.සම්පත් අධිකාරි මහතා**</u> කැකිරාව බල ප්‍රදේශය තුල ගලි බැහැර කිරිම සඳහා ස්ථානයක් නොමැති බැවින්,ගලි අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් සකස් කිරිමටත්, මලව වැව ආශ්‍රිතව සංචාරක ආකර්ශන ස්ථානයක් ලෙස සකස් කිරිමටත් , එමඟින් සභාවට විශාල ආදායමක් උත්පාදනය කිරිමට හැකි බවට යෝජනා කරන ලදී.

06.2025 වර්ෂයේ මැයි මස ආදායම් වියදම් වාර්තාව ( එල්.ජී.06 සහ එල්.ජී.13 වාර්තාව)

කැකිරාව ප්‍රාදේශීය සභාවේ මැයි මාසයට අදාලව ආදායම් වියදම් වලට අදාල වාර්තා ඉදිරිපත් කර ඇති අතර, ඒ පිළිබඳව සාකච්ඡා කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට යෝජනාව

<u>**කමිටු තීරණ 2025/06**</u>
<u>**ගරු සභික A.A.ලයනල් මහතා**</u>
කැකිරාව ප්‍රාදේශීය සභාවේ මැයි මාසයට අදාලව ආදායම් වියදම් වලට අදාල වාර්තා ඉදිරිපත් කර ඇති අතර, ඒ පිළිබඳව සාකච්ඡා කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී .

<u>**ගරු සභික C.A.H.M.නිමල්සිරි චන්ද්‍රසේකර මහතා**</u>
එම යෝජනාව ස්ථිර කරන ලදී

කැකිරාව ප්‍රාදේශීය සභාවේ මැයි මාසයට අදාලව ආදායම් වියදම් වලට අදාල වාර්තා ඉදිරිපත් කර ඇති අතර, ඒ පිළිබඳව සාකච්ඡා කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට නිර්දේශ කරන ලදී.

වීදි පහන් සවි කිරිමවලට අදාලව ජනතා ඉල්ලීම් විශාල ලෙස පවනතින බැවින්, ඒවා සකස් කිරිමට කටයුතු කල යුතු බවත්, සකාච්ඡා කරන ලද අතර, සේවකයින්ගේ හිඟකම හා දැනුමවත් භාවය පිළිබඳ ගැටළු පවතින බවත්,ඒ සඳහා **ගරු සභික A.A.ලයනල් මහතා විසින්** සම්පත් දායකයෙකු සම්බන්ධ කර අවශ්‍ය දැනුම ලබා දීමට හැකියාව පවතින බව පවසා සිටින ලදී. එමෙන්ම හබරණ පලුගස්වැව ප්‍රදේශයේ දරුවන්හට ශිෂ්‍යත්ව වැඩසටහනක් පවත්වන බැවින් , සභාව ලෙස දායකත්වන් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. **ගරු සභික D.U.G.N.B.දොඩම්වල මහතා** දරුවන් වෙනුවෙන් සිදු කරන කාර්යයක් බැවින් , එය ඉතා හොඳ වැඩසටහනක් බවත්, එය කොට්ඨාසයකට පමණක් නොව බල ප්‍රදේශයම ආවරණය වන ලෙස සිදු කිරිම සුදුසු පවසා සිටින ලදී.

ප්‍රජා සංවර්ධන අංශය මඟින් වාර්ෂිකව මෙවැනි වැඩසටහන් සිදු කරන බැවින්, මූල්‍යමය වශයෙන් ප්‍රතිපාදන ලබා දිය නොහැකි බවත්, ඒ සඳහා ද්‍රව්‍යමය ලෙස හැකියාව පරිදි අයවැය අනුව අනුමැතිය ලබා ගෙන දායකත්වය ලබා දීමට කටයුතු කිරිම සුදුසු බව සාකච්ඡා කරන ලදී .

ඒ අනුව මෙදිනට සාකච්ඡා කිරිමට වෙනත් කරුණු නොමති බැවින්, ලබන මස 09 වන දින නැවත කමිටුව රැස්වීමටත් සාකච්ඡා කරන ලද අතර, කමිටුවේ කටයුතු ප.ව.12.45 ට පමණ නිමා කරන ලදී.

| | |
|---|---|
| 2025.06.16 දින<br>ප්‍රාදේශීය සභාව,<br>කැකිරාව. | කමිටු සභාපති,<br>ප්‍රාදේශීය සභාව,<br>කැකිරාව. |

| | | |
|---|---|---|
| 01.ගරු සභාපති | - සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා | ....................................... |
| 02. ගරු උප සභාපති | - L.S.W.K.ඉමදූව මහතා | ....................................... |
| 03. ගරු සභික | - C.A.H.M.නිමල්සිරි චන්ද්‍රසේකර මහතා | ....................................... |
| 04. ගරු සභික | - H.නවරත්න බංඩාර මහතා | ....................................... |
| 05. ගරු සභික | - A.A.ලයනල් මහතා | ....................................... |
| 06. ගරු සභික | - D.U.G.N.B.දොඩම්වල මහතා | ....................................... |
| 07. ගරු සභික | - N.D.L.නිවුන්හැල්ල මහතා | ....................................... |
| 08. ගරු සභික | - A.M.T.සම්පත් අධිකාරි මහතා | ....................................... |
| 09. සමාජ ක්‍රියාකාරී | - රෝහණ සම්පත් දිසානායක මහතා | ....................................... |

පරිත්‍යාග 38000
32 550

70550 මුළ මුදල